	වරිපනම් විරෝධතා පරීක්ෂණ	165	176	246	228	246	176	190	211	191	192	279	285
එකතුව		7396	7088	7172	7353	7633	7419	7810	8217	8428	6890	6793	6610

6.3 *මානව සම්පත් සංවර්ධනය*

දැනුම, ආකල්ප හා කුසලතා තේමාකර ගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුළින් (Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයත්, අභිප්‍රේරණය, කාර්ය සාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුළින් සේවක කාර්යක්ෂමතාව හා කැපවීම යන මූලධර්මයත් සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී.

දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය දක්වා විහිදී යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ වෘත්තීය විශිෂ්ඨත්වය ලඟාකර ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම සිදු කරයි.

පැවැත්වූ පුහුණු වැඩසටහන් - 2024.12.31 දිනට

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (පැය/ දින)	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම ලබා ගත් දැනුම
				දේශීය(රු)	විදේශීය(රු.)		
1	**01.** නව තාක්ෂණය භාවිතයෙන් වැටුප් සකස් කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ පුහුණු වැඩසටහන	9	පැය 18	රු.162,000.00	-	දේශීය	•GPS ස්ථාපනය කිරීම සහ ආරම්භ කිරීම •ලිපිගොනු නඩත්තු කිරීම •සේවක ප්‍රධාන ගොනුව •දත්ත ඇතුළත් කිරීම •රාජ්‍ය නිළධාරීන් සඳහා ණය •සහය දක්වන බැංකු ණය දෙපාර්තමේන්තුව •EPF,ETF සහ PSPF •විවිධ මෙහෙයුම් ක්‍රියාකාරකම් •වැටුප් සැකසීම,වාර්තා කිරීම සහ මුද්‍රණය කිරීම •GPS SLIP පද්ධතිය (ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය)
2	**05.** ව්‍යාපාර තක්සේරුකරණය සම්බන්ධව ඉහළ කළමණාකාරීත්වය වෙනුවෙන් පවත්වනු ලබන පුහුණු වැඩසටහන	19	පැය 06	රු. 32,500.00		දේශීය	•ව්‍යාපාර තක්සේරුකරණයට අදාළ විෂය පිළිබඳ හැදින්වීම සහ තක්සේරුකරණ ක්‍රියාවලිය

3	07. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මඟින් පවත්වනු ලබන ජාත්‍යන්තර සමුළුවICREMV	439	දින 03	රු.300,000.00		දේශීය	තක්සේරුව සඳහා වන ප්‍රමිත : ගෝලීය දේපල ආයෝජන සඳහා මූලික පදනම
							වත්කම් කාර්ය සාධනය සහ පරිශීලක අත්දැකීම් ප්‍රශස්ත කිරීම: තිරසාර සංවර්ධනය සඳහා පහසුකම් කළමනාකරණය සහ දේපල වටිනාකම් වැඩිදියුණු කිරීම
							සංචාරක හා දේපළ වෙළඳාම් සංවර්ධනය සුසංයෝග කිරීමේදී ආර්ථික ප්‍රතිපත්තියේ කාර්යභාරය
							ව්‍යාපෘති කළමනාකරණය මඟින් සංචාරක ව්‍යාපාරයේ තිරසාර සංවර්ධනයේ දායකත්වය
							සංචාරක කර්මාන්තයේ තක්සේරු ගතිකත්වය: ආර්ථික අභියෝග සහ දේපල වටිනාකම වර්ධනය කිරීමේ ප්‍රවණතා
							දේපල හා සංචාරක ක්ෂේමයේ තිරසාර සංවර්ධන උපායමාර්ග: අනාගත ප්‍රවණතා
							සංචාරක සහ ආගන්තුක සත්කාර වත්කම් තක්සේරු කිරීම
							ඩිජිටල් සංක්‍රාන්ති මඟින් දේපළ වෙළඳාම් සහ සංචාරක ක්ෂේත්‍රයේ නවෝත්පාදනයේ ඊළඟ රැල්ල.
4	08.විනය සහ කාර්යාලීය ආචාර විධි	27	සැය 06	රු.196,000.00		දේශීය	• වැඩ පරිසරය පිළිබඳ දැනුම
							• ආකල්ප හා කුසලතා වර්ධනය
							• අවශ්‍ය තාක්ෂණික දැනුම
							• මහජන සම්බන්ධතාවය
							• සේවක අභිප්‍රේරණය
							• ආයතනයේ නිලධාරීන්ගේ කාර්ය භාරය වගකීම හා යුතුකම් පැහැදිලි කර දීම
							• සාමාන්‍ය හැසිරීම විනය පිලිබඳ දැනුවත් කිරීම
							• පුද්ගල අභියෝග වලට මුහුණ දෙන්නේ කෙසේද යන්න
							• කණ්ඩායමක් තුල ඔබගේ වගකීම
							• පුද්ගල අභිවෘද්ධිය (ඇඳුම් පැළඳුම්, හැසිරීම සහ ඉරියව්)
							• කාල කළමනාකරණය
							• ධනාත්මක චින්තනය තුලින් පෞරුෂ වර්ධනය
							• පුද්ගල හා ආයතනික ප්‍රතිරූප
							• කාර්යාල හා සමාජ ආචාර විධි
							• පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටු කිරීම තුල සේවා තෘප්තිය

5	09(i.) E-තක්සේරුකරණයට පිළිබඳ පුහුණු වැඩසටහන	482	පැය 06	රු.536,233.00		දේශීය	·E- තක්සේරුකරණයට අදාළ මොබයිල් ඇප් පිළිබඳ දැනුම ලබා දීම,
	09 (ii) ගිණුම් කටයුතු පිළිබඳ පුහුණු සැසි මාලාව(කණ්ඩායම් 01 සහ 02)	41	දින 02	රු.60000.00		දේශීය	·දෙපාර්තමේන්තු ගිණුම් කටයුතු සඳහා ඊට සමගාමීව
	09(iii) තක්සේරු නිලධාරීන් සඳහා වන වත්මන් කටයුතු පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව	59	පැය 06	රු.73,340.00		දේශීය	· වරිපනම් දත්ත ,විකිණුම් හා කුලී දත්ත ඩිජිටල්කරණය කිරීම(SPRR), දෙපාර්තමේන්තු නියෝග 320 හා ඊ-තක්සේරු ක්‍රමවේදය
							· ප්‍රාග්ධන තක්සේරු ක්‍රමවේදය යටතේ වරිපනම් තක්සේරු නිම කිරීම සඳහා වූ නියදි පරීක්ෂාව
							· මූල්‍ය වගකීම් කෙරෙහි තක්සේරුකරුගේ කාර්යභාරය
							ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම.
							· දෙපාර්තමේන්තුව තුළ තක්සේරුකරුවන්ගේ ආයතනික කාර්යභාරය
							· අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් තක්සේරුකරුගේ කාර්යභාරය.
	09(iv) E-තක්සේරු ක්‍රමවේදය සම්බන්ධ පුහුණු වැඩසටහන (කණ්ඩායම් 01 සහ 02)	66	පැය 18	රු. 79,044.00		දේශීය	· E- තක්සේරුකරණයට අදාළ මොබයිල් ඇප් පිළිබඳ දැනුම ලබා දීම,
	09(v)) E-තක්සේරු ක්‍රමවේදයට අදාළව විෂය ලිපිකරුවන් සහ සංවර්ධන නිළධාරීන් සඳහා වන පුහුණු වැඩසටහන	54	පැය 06	රු 43,730.00		දේශීය	· E- තක්සේරුකරණයට අදාළ මොබයිල් ඇප් පිළිබඳ දැනුම ලබා දීම,

	09(vi) ස්ථාවර වත්කම් , වට්ටෝරු භාණ්ඩ , පාරිභෝගික භාණ්ඩ, උප පත්‍රිකා වෙන්කර හඳුනාගෙන නොමැති වීම හා එම එකිනෙකට වෙන් වෙන්ව පවත්වාගෙන යා යුතු ලේඛන පිළිබඳ දැනුම හා නිවැරදිව යාවත්කාලීන කිරීම සඳහා නිසි මාර්ගෝපදේශ සහිත පුහුණු වැඩසටහන	**36**	**පැය 06**	**රු. 35830.00**		**දේශීය**	· ප්‍රධාන ඉන්වෙන්ට්‍රි, බඩු වට්ටෝරු ලේඛන , පාරිභෝජන ද්‍රව්‍ය ලේඛන, උප පත්‍රිකා පොත් ලේඛන නිවැරදිව වෙන් කර හඳුනාගෙන පවත්වාගෙන යාම හා එම ලේඛන පිළිබඳව ඇති වගකීම
							· වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සඳහා කමිටු පත් කිරීම, සමීක්ෂණ සිදු කිරීම, සමීක්ෂණ වාර්තා සකස් කිරීම සහ අපහරණ කටයුතු
							· ඉන්වෙන්ට්‍රි භාණ්ඩ මිලදී ගැනීමට පෙර හා පසු ක්‍රියාවලිය, ඉන්වෙන්ට්‍රි අංක හඳුනා ගැනීම සහ ලේඛනගත කිරීම, වෙනත් ආනුශංගික කරුණු
							· ප්‍රධාන ඉන්වෙන්ට්‍රි, බඩු වට්ටෝරු ලේඛන , පාරිභෝජන ද්‍රව්‍ය ලේඛන, උප පත්‍රිකා පොත් ලේඛන හඳුනා ගැනීමේදී ඇතිවිය හැකි දෝෂ හා ගබඩාවල සිදුවන දෝෂ හඳුනාගැනීම, ඒවා නිවැරදි කිරීම හා එම දෝෂ වළක්වා ගැනීමේ ක්‍රමවේදයන්
	09(vii) නවක තක්සේරුකරුවන් බඳවා ගැනීමේ පුහුණු වැඩමුළුව	**21**	**පැය 30**	**රු.196,130.00**		**දේශීය**	·තක්සේරු ඒකකය සහ ඒකක කළමනාකරණය **I** සහ **II**
							·තක්සේරු නිළධාරීන් සඳහා මූල්‍ය කළමනාකරණය
							·තක්සේරු නිළධාරීන් සඳහා පරිපාලනය
							·දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අපේක්ෂා
							·දෙපාර්තමේන්තුවේ ප්‍රගති පාලනය සහ **E-** තක්සේරුකරණයට අනුගත වීම පිළිබඳ තක්සේරුකරුවන්ගේ වගකීම
	09(viii) ඵලදායිතා පුහුණු වැඩසටහන- පළමු අදියර	**125**	**පැය 06**	**රු.192,100.00**		**දේශීය**	· ඵලදායිතා සංකල්පය පිළිබඳ
	09(ix) ඵලදායිතා පුහුණු වැඩසටහන- පළමු අදියර	**178**	**පැය 06**	**රු.404,700.00**		**දේශීය**	· ඵලදායිතා සංකල්පය පිළිබඳ

	09(x) ධනාත්මක චින්තනය මගින් පුද්ගලික ජීවිතය මෙන්ම කාර්යාල කටයුතු තුළද ආතතියකින් තොරව කටයුතු කිරීම තුළින් කාර්යාල කටයුතු ඉහළ නැංවීම පිළිබඳව දේශනය	**125**	**පැය 06**	**රු. 132,213.00**		**දේශීය**	• ධනාත්මක චින්තනය මගින් පුද්ගලික ජීවිතය මෙන්ම කාර්යාල කටයුතු තුළද ආතතියකින් තොරව කටයුතු කිරීම තුළින් කාර්යාල කටයුතු ඉහළ නැංවීම පිළිබඳව
	09(xi) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දේපළ ලියාපදිංචි කිරීම සම්බන්ධව දේශනය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුඹුරු ඉඩම් ගොඩ කිරීම හා ඒ ආශ්‍රිත ගැටළු සාකච්ඡා කිරීමේ දේශනය	**41**	**පැය 06**	**රු. 76,000.00**		**දේශීය**	• ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දේපළ ලියාපදිංචි කිරීම • ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුඹුරු ඉඩම් ගොඩ කිරීම හා ඒ ආශ්‍රිත ගැටළු සාකච්ඡා කිරීමේ දේශනය
	09(xii) ශ්‍රී ලංකා තක්සේරු සේවයේ **II**පන්තියේ **II**ශ්‍රේණියේ සහකාර තක්සේරුකරුවන් සඳහා වූ කාර්යක්ෂමතා කඩයිම් විභාගය **(2024) -** අභ්‍යන්තර විභාග පුහුණු වැඩසටහන /අදියර **02**	**19**	**දින 01**	**නොමිලේ**		**දේශීය**	•තත්ත්ව වාර්තාවක් පිළියෙල කිරීම **(ප්‍රායෝගික පරීක්ෂණය)** •වරිපනම් තක්සේරුව **(ප්‍රායෝගික පරීක්ෂණය)**
	09(xiii) වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන දත්ත ඩිජිටල්ගත කිරීම සඳහා තාවකාලිකව බඳවා ගන්නා ලද විශ්ව විද්‍යාල සිසුන් සඳහා සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන	**270**	**දින 10**	**රු.236,110.00**		**දේශීය**	වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන දත්ත ඩිජිටල්ගත කිරීම

6	**10.** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **18/2020** අනුව භාෂා පාඨමාලාව - දෙමළ	**8**	පැය **150** හා පැය **200**	නොමිලේ		දේශීය	• භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීම
7	**11(i)**බාහිර පුහුණු ආයතන මගින් යොමු කරන ලද පුහුණු වැඩසටහන් ජාතික විදුලිබල මණ්ඩලය මඟින් කුකුළේ ගඟ ව්‍යාපෘති කාර්යාලය සමඟ වත්කම් තක්සේරු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන **(කණ්ඩායම් 01 සහ 02)**	**97**	දින **04**	නොමිලේ		දේශීය	•වත්කම් තක්සේරු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන
	11(ii) රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ පුහුණු වැඩසටහන(පළමු කණ්ඩායම)	**21**	පැය **12**	රු.**266,500.00**		දේශීය	•රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ හැඳින්වීම •පොදු ප්‍රසම්පාදනයේ අරමුණු සහ කාර්යභාරය •රාජ්‍ය ප්‍රසම්පාදන වර්ග සහ ක්‍රම •ලංසු ලේඛන සකස් කිරීම •ලංසු විවෘත කිරීමේ කමිටුවේ වගකීම් සහ කාර්යයභාරය •**TEC** සහ ප්‍රසම්පාදන කමිටුව •ලංසු ඇගයීම •කොන්ත්‍රාත් වසා දැමීමේ ක්‍රියාකාරකම්
	11(iii) මූලික විමර්ශනය පිළිබඳ පුහුණු වැඩමුළුව	**3**	දින **02**	රු. **39,000.00**		දේශීය	•රජයේ නිළධාරීන්ගෙන් සිදුවිය හැකි වැරදි •එම වැරදි සඳහා ලබා දෙන දඬුවම් •රජයේ නිළධාරීන්ගෙන් අපේක්ෂා කරන සාමාන්‍ය හැසිරීම සහ විනය •සාමාන්‍ය විනය කාර්යපටිපාටිය හැඳින්වීම •මූලික විමර්ෂන නිළධාරියෙකුගේ කාර්යභාරය •මූලික විමර්ෂන වාර්තාව සකස් කිරීම හා චෝදනා පත්‍රයක් කෙටුම්පත් කිරීම •මූලික විමර්ශන සඳහා ගෙවීම

	11(iv) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණය හා තක්සේරු විද්‍යා උපාධිය හදාරන අවසන් වසර සිසුන් සඳහා සීමාවාසික පුහුණු වැඩසටහන	**34**	**සෑ 06**	**රු.20000.00**		**දේශීය**	තක්සේරුකරණය පිළිබඳ දැනුම
	11(v) අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන	**2**	**සෑ 06**	**රු.14000.00**		**දේශීය**	·අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කිරීමේදී අවධානයට ලක් කළ යුතු කරුණු ·අමාත්‍ය මණ්ඩල සංදේශයට ඇතුළත් විය යුතු කරුණු ·අමාත්‍ය මණ්ඩල සංදේශය කෙටුම්පත් කිරීම ·අමාත්‍ය මණ්ඩල සංදේශයන් නිකුත් කිරීම පිළිබඳ මනා මාර්ගෝපදේශකත්වය ·අමාත්‍ය මණ්ඩල කාරක සභා කාර්යය පටිපාටිය ·අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳ ව්‍යවස්ථාපිත ක්‍රියාමාර්ග ·අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ලේකම්වරයාගේ වගකීම
8	**12.** ශිෂ්‍යත්ව (පශ්චාත් උපාධි / ඩිප්ලෝමා සහ වෙනත් පාඨමාලා	**11**		**රු.5,935,000.00**		**දේශීය**	තක්සේරු වෘත්තියට අදාළ ඉහළ න්‍යායාත්මක දැනුම මෙම පශ්චාත් උපාධිය අවසානයේ අපේක්ෂා කෙරේ.

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංශය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අභ්‍යන්තරයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	-		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගලික පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදී බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	**2014.05.11** දිනැති අංක **171/2004** දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට **(NBD)** නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. **134 (2) DMA / 1 - 2019** අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම අනුව මාසයක කාලය තළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ	.	
6.3	**2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **40 (4)** උප වගන්තිය ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි **134(3)** ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	විගණන හා කළමකාරණ කමිටු			
7.1	**DMA** චක්‍රලේඛ **1-2019** අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු **04** ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක **01/2017** දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ **07** වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ **13** වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම. සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක **05/2016** අනුව , භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම. මු.රෙ. **772** අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස **06** කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ. **103 ,104 , 109** හා **110** ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	**2016.12.29** දිනැති අංක **2016/30** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **3.1** ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කලමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජන			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයෙන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. **94(1)** ප්‍රකාරව , සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	**සීමාවන්ට අනුකූල වීම**	**අනුකූල වේ**		
12.2	**හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම**	**අනුකූල වේ**		
12.3	**වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.**	**අනුකූල වේ**		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	**කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම**	**අනුකූල වේ**		
13.2	**පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම**	**අනුකූල වේ**		
14	**අග්‍රිම ගිණුම**			
14.1	**සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම**	**අනුකූල වේ**		
14.2	**මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම**	**අනුකූල වේ**		
14.3	**මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම**	**අනුකූල වේ**		
14.4	**අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම**	**අනුකූල වේ**		
15	**ආදායම් ගිණුම**			
15.1	**අදාළ රෙගුලාසිවලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම**	**අනුකූල වේ**		
15.2	**රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකට සෘජුව ම ආදායමට බැර කර තිබීම**	**අනුකූල වේ**		
15.3	**මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම**	**අනුකූල වේ**		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	**අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම**	**අනුකූල වේ**		
16.2	**කාර්ය මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම**	**අනුකූල වේ**		
16.3	**20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම**	**අනුකූල වේ**		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	**තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම**	**අනුකූල වේ**		
17.2	**ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම**	**අනුකූල වේ**		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක **05/2008** හා **05/2018(1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ **2.3** ඡේදයේ පරිදි , පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	**2018.01.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/2018** ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය **12** කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම **01** හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ **6.5** පරිච්ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම 01



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. TPD/D/GVD/02/24/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී
තක්සේරු දෙපාර්තමේන්තුව

ඡේදය 251 - තක්සේරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ඡේදය 251 - තක්සේරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2024දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම්

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ

+94 11 2 88 70 38 - 39 +94 11 2 88 72 23 www.naosl.gov.lk

වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සහක් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සහක් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජාය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව තක්සේරු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජාය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සංවේදී ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරීදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සවිලදාගි අභ්‍යන්තර පාලන පද්ධතියක් සහක් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සෘජුව විය යුතු අතර එම පද්ධතියේ සවිලදාගිත්වය පිළිබඳව නිලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය පවතින්නේ ද සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සම්මතයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සංවේදී ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සංවේදී ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි සහ

හෝ සාමූහික ලෙස බලපෑම් කිරීම ප්‍රමාණාත්මක ගාවදාය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මක ගාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි එහා බලපෑම් පාන රදා පවතී.

මූ ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකසිලිමත්වයින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී ව-ඵා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් ඕදවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්හෙන් ඕදවන බලපෑමට වඩා වංචාවකින් ඕදවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුක්ෂන්ධානයෙන්, වාසන ලේඛන සැකසීමෙන්, චේතනාත්මක මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය ඕළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම මිණිස අභ්‍යන්තර පාලනය ඕළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල වපුකය සහ අන්තර්ගතය සඳහා සාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ආකාරයින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල වපුකය හා අන්තර්ගතය සඳහා සාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ඇගයා ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන මොහොතවලිනි, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු ඕළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා ඕළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුකූල වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ඕළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවැති හිඟ තක්සේරු ආදායම් රු.896,496,121 ක් සමාලෝචිත වර්ෂය තුළදී රු. 149,765,247ක් හෙවත් සියයට 16.7 ක ප්‍රමාණයක් අයකරගෙන තිබුණි. තවද, විගණනය වෙත ඉදිරිපත්කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ පැවැති රු. 748,730,874ක් වූ මුළු හිඟ තක්සේරු ආදායමෙන් සියයට 90.47 ක් එනම් රු. 677,342,620.67ක් ආයතන 10 කට අදාළව වන අතර ඉන් සියයට 66.48 ක ප්‍රමාණයක් නාගරික සංවර්ධන අධිකාරිය (UDA), S.W.R.D බණ්ඩාරණායක අනුස්මරණ ජාතික පදනම හා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යන ආයතනවලින් අය විය යුතු වේ. එසේ වුවද, අදාළ ආයතන සමඟ විධිමත් එකඟතාවයකට පැමිණ හිඟ තක්සේරු ආදායම් අයකර ගැනීම සඳහා උචිත හා කාලීන්ම ක්‍රමවේදයක් හදුන්වාදී ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත් වී තිබුණි.

(ආ) 2008-2013 කාලච්ඡේදයට අදාළව UDA සහ ශ්‍රී ලංකා ඉඩම් තොටිකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් අයවිය යුතු හිඟ තක්සේරු ආදායම් පිළිබඳව විධිමත් වාර්තා තබා නොගැනීම (තක්සේරුව සිදුකළ පළාත් කාර්යාලය පිළිබඳ තොරතුරු ඇතුළුව) හේතුවෙන් පිළිවෙලින් රු.171,814,919ක් හා රු.9,547,400ක් මේ දක්වා අයකර ගැනීමට නොහැකිව ඉදිරියට ගෙන එමින් පවතී. තවද, හිඟ ආදායම් වාර්තාව අනුව ආයතනය භදුනා ගත හොඳැකි ලිපි ගොනු 04කට අදාළව රු.478,320 ක් හා ගොනු අංකය හෝ සඳහන් නොවූ තක්සේරු ආදායම් ගොනු 04 කට අදාළව එකතුව රු.365,135ක හිඟ ආදායම් පැවතුණි. එසේ වුවද, එකී හිඟ මුදල් අයකරගැනීමට හෝ ඒ පිළිබඳව විගණිවයුතු තාරිඛවලට එරෙහිව ගනුදෙනු ක්‍රියාත්මක ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා කාධනීය පියවරක් ගෙන නොතිබුණි.

3.2 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50(II) ප්‍රකාරව වර්ෂයේ වියදම් ඇස්තමේන්තු ගැණිමක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ඉණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවත්, ප්‍රතරාවර්තන වැය විෂයන් 04ක ප්‍රතිපාදන ඉතිරිය සියයට 12-100 අතර පරාසයක පැවැතුණි.

(ආ) 2024 වර්ෂයේ ක්‍රියාකාරී කැලැන්ඩරයට අනුව මුළු මූලධන වියදම් සඳහා රු.103,000,000 ක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණද, මූලධන වැය විෂය 2001, 2002 සහ 2401 යටතේ අපේක්ෂිත කාර්යයන් ඉදුනාගෙන නොතිබූ අතර වාර්ෂික ඇස්තමේන්තුව මඟින් වෙන් කරනා තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මි.10.9ක්, රු.මි.04ක් සහ රු.මි. 10.6ක් වශයෙන් සියයට 44 - 82 දක්වා පරාසයක ඉතිරි වීම නිරීක්ෂණය වුණි.

3.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සහ මිණුම්

(අ) 2023 මැයි 26 දින ස්ථාන මාරු වී ගිය එක් නිලධාරියකුගෙන් අය විය යුතු උත්සව අත්තිකාරම් රු.7,500 ක් අය කර ගැනීමට විගණිත දිනය තෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය රු. 983,482 ක් තුළ වසර 01ට වැඩි රු. 103,610 ක් වූ ණය ශේෂය විශ්‍රාම වාරිතෝෂිතයෙන් හෝ අයකර ගැනීමට විගණිත දිනය තෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) වැඩ තහනම් කළ නිලධාරීන් තිදෙනෙකුගෙන් වසර 10ට වැඩි කාලයක් පුරා අය නොවී පවතින රු. 308,614 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට වාර්තාවේ දිනය තෙක් අදහාරිතශේෂිත්තුව අපොහොසත් වී තිබුණි.

(ඈ) සේවය අත්හැර ගිය මාස 6ට වැඩි වසර 20 අඩු ණය ශේෂ දෙකක එකතුව රු.466,153ක් ඇතැරුවන්ගෙන් හෝ අයකර ගැනීමට විගණිත දිනය තෙක් කටයුතු කර නොතිබුණි.

(ඉ) මිය ගොස් වසරකට ඉහත්ත කාලයක් ගත වී ඇති නිලධාරියකුගෙන් අය විය යුතු රු.227,957ක් වූ ණය ශේෂය මේ දක්වා අයකරගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

කාර්යසාධනය

නීති ආඥාවේ කාර්යසාධනය සඳහා සඳහනාගත් ඉලක්කයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

5 කළමනාකරණ විවිධාංග

(අ) නාගරික පත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට අයත් වාහනයක හානි පිරිවැය තක්සේරුකිරීමට අදාලව මෝටර් රථ ප්‍රධාන දෙපාර්තමේන්තුවේ පරීක්ෂක නිලධාරියෙකුගේ නිර්දේශය හා එදිනම එම වාහනය ස්වාධීනව පරීක්ෂා කරන ලද දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුගේ පරීක්ෂණ වාර්තාව පිළිබඳව නොසළකා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වයඹ ප්‍රාදේශීය ඉංජිනේරු කළමනාකරුගෙන් ලබාගත් නිර්දේශයක් මත පදනම්ව ප්‍රාදේශීය තක්සේරුකරු විසින් නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු වෙත යොදන ලද සවිස්තරයට අනුව වාහනයේ හානිපූර්ණ පිරිවැය රු. 11,000,000 ක් ලෙස වාර්තාකර තිබුණි.

(ආ) නිල තක්සේරු ආදායම් වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලංකා බැංකුවෙන් අයවිය යුතු නිල තක්සේරු ආදායම් වූ රු.17,105,700ක් සඳහා වසර 10කට වැඩි කාලයක් ගත වී තිබුණද වාර්තාවේ දිනය තෙක් අයවී නොතිබුණු අතර, ගෘහ අයබදුවලින් හොරව තක්සේරුවට අදාළව කෙටුම්පත් තක්සේරු වාර්තාවක් 2014 ජනවාරි 31 දින නිකුත් තිබුණි.

(ඇ) යාන්ත්‍රික හාඟ අධ්‍යයන සහ පුහුණු ආයතනය සඳහා අංක 321/1/ඒ, හබරලෙවල් පාර, මාතුඉර, පන්නිපිටිය ලිමිනයේ පිහිටි ගොඩනැගිල්ලෙහි මාසික කුලිය 2016 දෙසැම්බර් 15 දිනැති තක්සේරු වාර්තාවට අනුව රු.1,250, 000 ක් ලෙස තක්සේරු කර වාර්තා කර තිබුණු අතර එම ගොඩනැගිල්ල වෙනුවෙන් වසර 07කට පසු 2024 පෙබරවාරි 14 දිනාව නිකුත් කර තිබූ තක්සේරු වාර්තාවට අනුව මාසික කුලිය රු.800,000ක් ලෙස එනම් මුල් තක්සේරු වටිනාකමට වඩා 36%කින් අඩුවෙන් තක්සේරු කර තිබුණි. තවද, ඒ පිළිබඳව වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා 2016 වර්ෂයේ තක්සේරු ලිපි ගොනුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) 2022 මැයි මස 09 දින රටට ඇති වූ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ගිදුටු දේපළ හානි වෙනුවෙන් තක්සේරු වාර්තා නිකුත් කිරීම පිළිබඳව නියදි පරීක්ෂණයට අනුව අදාල මුලික තක්සේරු වාර්තා ලබාදීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල තීරණ සහ ජනාධිපති නියෝග, දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉල්ලීම් සහ දේපළ අයිතිකරුවන්ගේ ඉල්ලීම් සැලකිල්ලට ගෙන ප්‍රධාන තක්සේරුකරු විසින් එකී තක්සේරු අගයන්හේ වටිනාකම් සියයට 22 සිට සියයට 158 දක්වා පරාසයකින් වැඩිකර වාර්තාකර තිබුණි. ඒ අනුව, තක්සේරු 16කට අදාලව මුල් තක්සේරු වාර්තාවලට සංශෝධනවල දෙවන තක්සේරු වාර්තාවෙන් තක්සේරු වටිනාකම් එකතුව රු.384,081,900 සිට රු. 580,153,100ක් දක්වා සියයට 51 ක වැඩිවීමක් වාර්තාකර තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තරාස කාර්ය මණ්ඩලය

තමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 391ක් හෙවත් සියයට 32 ක් පුරප්පාඩුව පැවතුණි. එසේ වුවද, කාර්ය සාධනය කෙරෙහි කෙළින්ම බලපාතු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ තෘතීය මට්ටමේ අනුමත හේවත සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 59 ක් හා සියයට 38 පුරප්පාඩුව පවතුණද එම පුරප්පාඩු ඇතුලු පුරප්පාඩු පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා විධිමත් සියවර ගෙන නොතිබිණ.



ඩී.ජී.ඒ.එස්. අතුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට